# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2131/60 - 2019 ජූලි මස 13 වැනි සෙනසුරාදා - 2019.07.13

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

#### රාජ්‍ය සේවා කොමිෂන් සභාව

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 57 (1) වන ව්‍යවස්ථාව ප්‍රකාරව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් බලතල පැවරීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 57 (1) වන ව්‍යවස්ථාව ප්‍රකාරව අංක 2043/13 හා 2017.10.30 දිනැති *අති විශෙෂ ගැසට් නිවේදනය* මගින් සංශෝධනය කරන ලද, අංක 2014/3 හා 2017.04.11 දිනැති *අති විශෙෂ ගැසට් නිවේදනයේ* සඳහන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරන ලද බලතල පැවරීම 2019.07.11 දින සිට බලපැවැත්වෙන අයුරින් පහත දැක්වෙන පරිදි තවදුරටත් සංශෝධනය කරනු ලැබේ.

"අ" උපලේඛනය

| *I තීරුව*<br>*නිලධාරී ගණය* | *II තීරුව*<br>*බලතල පවරනු ලබන රාජ්‍ය නිලධරයන්* | *III තීරුව*<br>*පවරන ලද බලතල* |
|---|---|---|
| 7. අධ්‍යාපන විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ අධ්‍යාපන විෂය යටතට ගැනෙන, ශ්‍රී ලංකා ගුරු සේවයේ ගුරුවරුන් | අධ්‍යාපන විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම් | I. රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලැබූ සේවා ව්‍යවස්ථාව/බඳවා ගැනීමේ පරිපාටිය අනුව පත්කිරීම හා උසස් කිරීම<br>II. විශ්‍රාම වැටුප් සංග්‍රහයේ 2. 17 වගන්තිය යටතේ විශ්‍රාම ගැන්වීම සඳහා අනුමැතිය ලබාදීම හැර අනෙකුත් සියලුම විශ්‍රාම ගැන්වීම් සඳහා අනුමැතිය ලබාදීම |
| | අධ්‍යාපන විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්/අමාත්‍යාංශ ලේකම් විසින් නම් කරනු ලැබ රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන අතිරේක ලේකම්වරයකු | I. රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලැබූ පරිපාටිය අනුව වාර්ෂික ස්ථාන මාරු කිරීම ඇතුළු සියලුම ස්ථාන මාරු කිරීම<br>II. රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ 3/2016 ප්‍රකාරව කාර්යක්ෂමතා කඩඉම් විභාග සම්බන්ධයෙන් සහන සැලසීම |


1A - PG 4595 — 20 (2019/07)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

''අ'' උපලේඛනය *(සම්බන්ධිතයි)*

| *I තීරුව*<br>*නිලධාරී ගණය* | *II තීරුව*<br>*බලතල පවරනු ලබන රාජ්‍ය නිලධරයන්* | *III තීරුව*<br>*පවරන ලද බලතල* |
|---|---|---|
| | අධ්‍යාපන විෂයභාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්/රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ<br><br>(පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් මෙම බලතල ක්‍රියාත්මක කිරීමට පෙර ඒ සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය පෞද්ගලිකව ලබා ගත යුතු ය) | I. විනය පාලනය හා සේවයෙන් පහ කිරීම<br>II. රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලැබූ ශ්‍රී ලංකා ගුරු සේවයේ සේවා ව්‍යවස්ථාවට අන්තර්ග්‍රහණය කිරීම<br>III. රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලැබූ ශ්‍රී ලංකා ගුරු සේවයේ සේවා ව්‍යවස්ථාවට අනුව උසස්වීම් ලබා දීම<br>IV. විශ්‍රාම වැටුප් සංග්‍රහයේ 2. 17 වගන්තිය යටතේ විශ්‍රාම ගැන්වීම සඳහා අනුමැතිය ලබාදීම |

රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් බලතල පවරන ලද අංක 2014/3 හා 2017.04.11 දිනැති අති විශෙෂ ගැසට් නිවේදනයේ සඳහන් අනෙකුත් කරුණු සහ ඒවාට විටින් විට කර ඇති සංශෝධනයන් නොවෙනස්ව පවතී

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අණ පරිදි,

එම්. ඒ. බී. දයා සෙනරත්,
ලේකම්,
රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

2019 ජූලි මස 11 වෙනි දින,
අංක 1200/9, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල,
රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයේ දී ය.

07 - 977

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.